භාෂාවකට ජනසමාජයේ චින්තනය හැඩගැස්වීමට කළ හැකි බලපෑම සම්බන්ධයෙන් අමුතුවෙන් කිවයුතු නොවේ. මේ නිසාම, ඇතැම් විට අතීතයේ සුලභව භාවිතයේ තිබූ යෙදුම් පවා වර්තමානය වන විට අනුචිත, අයෝග්‍ය බවට කතිකාවන් ඇති වෙමින් පවතී.

මෙවන් යෙදුම් වලට එක් උදාහරණයක් වන්නේ "හාම්පුතා" සහ "මෙහෙකරුවා/මෙහෙකාරිය" යන වදන් වේ. මෙවන් නාමකරණයන් ඔස්සේ වර්තමානයේ පවත්නා සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවයට වඩා වෙනස් වූ ස්වාමී-සේවක සම්බන්ධතාවයක් හැඟවෙන්නේ නැතිද? එම හාම්පුතා-මෙහෙකාර/වැඩකාර යන වදන් ඔස්සේ වඩාත් පසුගාමී සමාජ සම්බන්ධතාවයක් නොපෙන්වන්නේ යැයි ඔබ සිතන්නේද? මෙම පුවත් වාර්තාවේ අදාළ සන්දර්භය සලකා බලන විට, "හාම්පුතා-මෙහෙකාරිය" යන යෙදුම් වෙනුවට "ගෘහ සේවක/ගෘහ සේවිකා-සේවායෝජකයා/සේව්‍යයා/සේවා ලබාගන්නා" වැනි යෙදුම් භාවිතය වඩාත් උචිත නොවන්නේද? එසේ නැතිනම් ඊට වඩාත් යෝග්‍ය වෙනත් යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?

"ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය" ලෙසින් අතීතයේ භාවිතා වූ නාමය පවා මේ වනවිට "ලංකා සේව්‍ය සම්මේලනය" ලෙසින් වෙනස් වී ඇති බවද මෙසේම සඳහන් කරමු.මේ පිළිබඳව මීට පෙර අප පළ කළ සඳහනට ප්‍රවේශය මෙතැනින්: https://m.facebook.com/story.php?story_fbid=1132603300428059&id=228455347509530

#MediaEthicsSL #Lankadeepa #SinhalaPress